# <u>අවුකන හා සමාධි පිළිම වහන්සේලා</u>

දීපවංසය, මහාවංසය හා අනෙක් වංසකතා ලිවීම ඇරඹී ඇත්තේ හතරවැනි සියවසේ දී පමණ ය. එතෙක් නොලියැවුණු වංසකතා එකල ලිවීම ඇරඹීමට ද හේතුවක් තිබිය යුතු ය. පඬුඅබා රජුගෙන් සියවස් හතකට පමණ පසුව ද යක්ෂ ගෝත්‍රිකයන් මුළුමනින් ම සිංහල ජාතියට ඇතුල් කරගැනීමට නොහැකි වී ඇති බව පමණක් නොව යක්ෂ ගෝත්‍රිකයන්ට පඬුඅබා පරම්පරාවට කෙසේ වෙතත් ගැමුණු රජතුමාගෙන් ඇරඹුණු රජ පරම්පරාවට අභියෝග කිරීමට තරම් ශක්තියක් මෙකල වන විට තිබී ඇත.

මෙහි දී පඬුඅබා පරම්පරාවට කෙසේ වෙතත් ගැමුණු රජුගෙන් ඇරඹුණු පරම්පරාව යන්නෙන් අදහස් වන්නේ ගැමුණු කුමරු නව රජ පරපුරක් බිහිකළ බව ය. ගැමුණු කුමරුගේ පියා හා මව රුහුණේ විසූ අර්ධ වෛදික රජ පෙළපත් දෙකකින් පැවත ආවෝ වෙති. අර්ධ වෛදිකයන් අනුරාධපුරය අවට මල්වතු ඔය හා වෙනත් ගංගා ඔය අසබඩ මෙන් ම රුහුණේ ගංගා හා ඔය අසබඩ ද කුඩා රාජධානි ගොඩනගාගෙන ඇත. මේ කුඩා රාජධානි එකතුකර තරමක විශාල රාජධානියක් ගොඩනැගූ පළමු තැනැත්තා පඬුඅබා රජු ය. එතුමා අනුරපුර තම රාජධානියේ අගනුවර කරගත්තේ ය.

එහෙත් එතුමාට රුහුණ අවනත වූ බවක් නො පෙනෙයි. රුහුණේ කුඩා රාජධානි එකතුකර තරමක විශාල රාජධානියක් මාගම (මහගම හෙවත් ප්‍රධාන ග්‍රාමය - පසු කලෙක මහනුවර මෙනි) ගොඩනගා ඇත්තේ කාවන්තිස්ස රජු විසිනි. එතුමා රුහුණේ හැඩඔය හෙවත් කල්‍යාණිය අසබඩ විසූ රජ පෙළපතේ විහාර මහා දේවිය විවාහ කර ගත්තේ ද මේ බල ව්‍යාපෘතියේ කොටසක් ලෙසින් යැයි ඇතැම් ඉතිහාසඥයෝ පවසති. කාවන්තිස්ස රජු යටාලතිස්ස රජු ඔස්සේ දේවානම්පිය තිස්ස රජුට ගැටගැසීමට වංසකතා දරා ඇති උත්සාහය සාර්ථක යැයි කිවහැකි නො වේ.

වංසකතාවල සඳහන් ඉතිහාසය යනු ප්‍රධාන වශයෙන් ඒ කතා ලියන කාලයේ ජනප්‍රවාදයේ තිබූ කතා මිස වංසකතාකරුවන් නිර්මාණය කළ කතා නොවන බව පැහැදිලි ය. වංසකතාකරුවන් කර ඇත්තේ මූලික වශයෙන් ගත්කල ඒ ජනප්‍රවාද පොත්වල ලිවීම ය. වංසකතාකරුවන් විසින් එකතුකරන ලද කතා කිහිපයක් ද ඒ අතර තිබියේ නම් ඒ පුදුමයක් නො වේ. බුද්ධිමතුන් ලෙස ඔවුන් සමස්ත ඉතිහාස රාමුව තුළට කතා කිහිපයක් එකතු කරන්නට ඇත. ඒ සඳහා ඔවුන්ට යම් යම් සාක්ෂි තිබෙන්නට ඇත.

මේ කාලයේ, එනම් හතරවැනි සියවස පමණ වන විට ජනප්‍රවාදයේ වුව ද ඉතිහාස කතා ගෙතී ඇත්තේ අර්ධ වෛදිකයන්ට තම උරුමය සඳහා සටන්කරන්නට සිදු වීම නිසා යැයි උපකල්පනය කළ හැකි ය. ඒ උරුමයට අභියෝගයක් එල්ල කරන්නට ඇත්තේ වෙනත් කවුරුන්වත් නොව යක්ෂ ගෝත්‍රිකයන් ය. ගැමුණු රජුට ද යක්ෂ ගෝත්‍රිකයන් මුළුමනින් ම සිංහල ජාතියට එකතුකර ගැනීමට නොහැකි වූ බව ගෝඨයිම්බර ජයසේන කතාවෙන් පැහැදිලි වෙයි. ඒ කතාවෙන් පැහැදිලි වන තවත් කරුණක් නම් ඇතැම් යක්ෂ ගෝත්‍රිකයන්ට යම් යම් ධ්‍යාන ශක්තීන් තිබූ බව ය.

රිටිගල ජයසේනලා පමණක් නොව මහවැලි ගඟ ආසන්නයේ හා වෙනත් ප්‍රදේශවල ජීවත් වූ යක්ෂ ගෝත්‍රිකයන් අර්ධ වෛදිකයන්ට අභියෝග කිරීමට තරම් තත්වයකට මේ වන විට පත්වන්නට ඇත. ලම්බකර්ණ යනු යක්ෂ ගෝත්‍රික පෙළපතක් (වංශයක්) හෝ යක්ෂ ගෝත්‍රිකයන්ගේ ආධාරය ලැබූ පෙළපතක් වීමට ඇති ඉඩකඩ විශාල ය. අනුරාධපුරයේ රාජ්‍ය උරුමය ඉල්ලා යක්ෂ ගෝත්‍රිකයන් සටන් කිරීම ආරම්භ කරන්නට ඇත්තේ මේ අවධියෙහි විය යුතු ය. යක්ෂ ගෝත්‍රිකයන් අතර වූ බෞද්ධයන් (මේ වන විට ඇතැම් යක්ෂ ගෝත්‍රිකයන් බෞද්ධ වන්නට ඇතැයි සිතිය හැකි ය) මහාවිහාරය වෙනුවට අභයගිරිය තෝරාගත් බව ද පැහැදිලි ය.

අභයගිරිය දෙස අප බැලිය යුත්තේ මහායානික මූලස්ථානයකට වඩා යක්ෂ ගෝත්‍රිකයන්ගේ (ඇතැම් විට අබෞද්ධ යක්ෂ ගෝත්‍රිකයන්ගේ ද ) දායකත්වය ලැබූ මධ්‍යස්ථානයක් ලෙස ය. එහි මහායානික මතවාදවලට ඉඩ ලැබී ඇති මුත් එය මහායානික මධ්‍යස්ථානයක් නොවූ බව ඇතැම් ඉතිහාසඥයන්ගේ මතය වෙයි. අභයගිරිය වළගම්බා රජු කළ පිහිටුවන ලද්දකි. එහි එකල තිබෙන්නට ඇත්තේ ථෙරවාද බුද්දහම ය. එහෙත් පසු කලෙක එහි මහායාන මතවාදලට ද ඉඩ ලැබී ඇත. අභයගිරිය ථෙරවාදයෙන් කැඩී මහායානයට ගිය අවස්ථාවක් ගැන වංසකතාවල සඳහන් නො වෙයි. මේ සියල්ලෙන් අපට නිගමනය කළ හැක්කේ අභයගිරි ය ද ථෙරවාද මධ්‍යස්ථානයක් වූ බවත් එහෙත් එය මහායාන අදහස්වලට ද විවෘත වූ බවත් ය.

© Prof. Nalin De Silva

බොහෝ විට යක්ෂ ගෝත්‍රික බෞද්ධයන්ගේ දායකත්වය අභයගිරියට වූ බැවින් පසු කලෙක එය පහතට දැමීම සඳහා එය මහායානික මධ්‍යස්ථානයක් ලෙස හැඳින්වෙන්නට ඇත. මෙරට මහායාන බලපෑම් ඇතිවීමට ප්‍රධාන හේතුව අභයගිරියවත් යක්ෂ ගෝත්‍රිකයන්වත් නො වේ. ථෙරවාදය භාරතයේ පරාජයවීමත් සමග මෙහි ද මහායාන අදහස් පැතිර යෑම පුදුමයක් නො වේ.

ධාතුසේන රජු මෞර්ය වාංශික රජකු ලෙස හැඳින්වෙයි. අවුකන බුදු පිළිම වහන්සේ තනවන ලද්දේ එතුමන් විසින් යැයි කියනු ලැබෙයි. එහෙත් අවුකන බුදු පිළිමය මහායාන අදහස් මත නිර්මාණය කරනු ලැබූවකි. සාමාන්‍ය මිනිස් කයක් තිබූ බුදුන් වහන්සේ ථෙරවාදයට අනුව නිවන් අවබෝධ කරගත් මිනිසෙකි. නිවන් අවබෝධ කරගත් තථාගතයන් වහන්සේ පවතී ද නැත්ද ආදී දාර්ශනික මතිමතාන්තර මෙහි දී අදාළ නො වේ. ථෙරවාදී සම්ප්‍රදායට අනුව විශාල බුද්ධකාය නැත.

ධාතුසේන රජු මහාවිහාරයට පක්ෂපාත විය. එහෙත් එතුමා අතින් ද මහායානික අදහස් ප්‍රකාශයට පත් වී ඇත. අනෙක් අතට අභයගිරියට අයත් යැයි සැලකෙන සමාධි පිළිම වහන්සේ අධි මානුෂික ගුණ නිරූපණය නො කරයි. මහායාන අදහස් මහාවිහාරික භික්ෂූන් වහන්සේ නොදැනුවත් ව වුවත් මෙරට බෞද්ධ සංස්කෘතියට කාන්දු වී ඇත. මේ අදහස් අභයගිරියෙහි දැනුවත් ව සාකච්ඡා වී ඇත.

යක්ෂ ගෝත්‍රිකයන් හා ඔවුන් විසින් පිළිගනු ලැබූ ලම්බකර්ණ වාංශිකයන් ප්‍රබලවත්ම අර්ධ වෛදිකයන්ට ප්‍රශ්න ඇති වී තිබෙන බව පැහැදිලි ය. අනුරාධපුර රාජ්‍යයට වඩා උරුමකම් තිබෙන්නට ඇත්තේ අර්ධ වෛදිකයන්ට වුවත් යක්ෂ ගෝත්‍රිකයන්ට වඩා පැරණි ඉතිහාසයක් තිබූ බව පැහැදිලි ය. අර්ධ වෛදිකයන් අළුතෙන් ඉතිහාසයක් නිර්මාණය කරන්නට පෙළඹෙන්නට ඇත්තේ තම අයිතිය තහවුරු කරගැනීමට ය. ඒ නිර්මාණය ජනප්‍රවාදයෙහි මෙන් ම බුද්ධිමතුන් අතර ද සිදුවන්නට ඇත.

අද වුවත් ඉතිහාසය නිර්මාණය කෙරෙනු විමර්ශණය කළහොත් මේ කරුණු ක්‍රියාත්මක වන ආකාරය දැකගත හැකිවනු ඇත. දෙමළ ජනයා තමන් අවුරුදු දෙදහසකට වැඩි කලක් මෙරට සිටි බව කියති. ඔවුහු වෙනම රාජ්‍යයක් පිහිටුවීම සඳහා විවිධ තර්ක ගෙන එති. ඊනියා නිජභූමි සංකල්පයක් ගැන ඔවුහු කතා කළහ. මොවුන්ගේ සංකල්ප හා ඊනියා ප්‍රවාද අද ප්‍රවාදාත්මක තලයෙහි හා දේශපාලනයෙහි පරාජය කෙරී ඇත. එහෙත් තවමත් දෙමළ ජාතිවාදය පරාජය කෙරී නැත. දෙමළ ජාතිවාදය අද විසිරුණු දෙමළ ජනයා අතර ජීවත්කරවීමට බටහිරයෝ උත්සාහ දරති.

අද යාපනයේ ජීවත්වන දෙමළ ජනයාගේ ඉතිහාසය 1650 වසරෙන් ඔබ්බට නොයන බව අපි කියමු. අප සත්තකින් ම එසේ කියන්නේ දෙමළ ජාතිවාදයට එරෙහිව ය. දෙමළ ජාතිවාදය නොවන්නට අපට එවැනි අධ්‍යයනයක් කිරීමටවත් අවශ්‍ය නොවීමට තිබිණි. එහෙත් අප එහි දී ද අපේ ප්‍රවාද නිර්මාණය කරන්නේ අනෙක් සාධක සමඟ සංගත වන ආකාරයකින් මිස අපේ සිතැඟි අනුව නො වේ.

හතරවැනි පස්වැනි සියවස්වල ද ඉතිහාසය පිළිබඳ විවිධ ප්‍රවාද මතිමතාන්තර ආදිය නිර්මාණය වී ඇත. වාසනාවකට හෝ අවාසනාවකට හෝ යක්ෂ ගෝත්‍රිකයන් වෙන ම රාජ්‍යයක් ඉල්ලා නැත. ඔවුන් වැඩිම වුවහොත් කර ඇත්තේ අනුරාධපුර රාජධානිය තමන්ට දෙන ලෙස ඉල්ලීම ය. ඒ සඳහා ඔවුන් ඉතිහාස ප්‍රවාද නිර්මාණය කරන්නට ඇත. එසේත් නැතහොත් එතෙක් තිබූ ප්‍රවාද වර්ධනය කරන්නට ඇත. තවත් ඇතැම් ප්‍රවාදයක් හෝ මතයක් හෝ ඉවත දමන්නට ද ඇත.

අපේ ඉතිහාසයෙහි වැදගත් ම අවධිය වූයේ පස්වැනි සියවස හා ඒ ආසන්න වර්ෂය. මෙරට ඉතිහාසය පමණක් නොව අද දක්වා වූ අනාගතය ද නිර්මාණය වූයේ එකල ය. එය යුද්ධ මගින් මෙන් ම ප්‍රවාද නිර්මාණය මඟින් ද සිදු වී ඇත. ගැමුණු රජු ගැන පවා අප දන්නේ එකල ලියැවුණු ඉතිහාසය ය. ඒ ඉතිහාසයට පිටින් යන සාක්ෂි රැගත් පොත් පත් නැතිකිරීම පවා එකල සිදුවන්නට ඇත. වංසකතාවලට පෙර ලියැවුණු පොත්පත් ගැන සඳහන් වෙතත් අද ඒ පොත් දැක ගැනීමටවත් නැත. ඒ පොත්වල වෙනත් ඉතිහාසයක් තිබිණි ද?

වංසකතාවල සඳහන් ඉතිහාසය බොහෝ දුරට නටබුන් හා පුරාවිද්‍යාත්මක සාධක සමග එකඟ වන බැවින් අපට විසඳාගැනීමට අමාරු ප්‍රශ්න නැත. එහෙත් ධාතුසේන රජු මෞර්ය ලෙස හැඳින්වෙන්නේ ඇයි ද, සීගිරිය හෙවත්

© Prof. Nalin De Silva

සිහිගිරිය යනු කුමක් ද ආදී ප්‍රශ්නවලට පිළිතුරු වංසකතාවලින් බැහැරව ලබාගැනීමට සිදුවෙයි. මෙරට යක්ෂ උරුමයට වංසකතාවලින් සාධාරණය ඉටු වී නොමැති බව පැහැදිලි ය.

යක්ෂ ගෝත්‍රික ඉතිහාසය ඇතැම් විට මහායානය ඔස්සේ මගහැර ඇත. යක්ෂ ගෝත්‍රිකයන් යම් පිරිසක් බොහෝ කල් ගතවන තුරුම බෞද්ධයන් නොවී සිටීම ඔවුන්ට පාඩුවක් වී ඇත. යක්ෂ ගෝත්‍රියන්ට කලාත්මක හැකියාවක් තිබූ බව විජය කුමරු පැමිණියේ යැයි කියන දිනවල තිබි සංගීත උත්සවවලින් ද සීගිරි (සිහිගිරි) චිත්‍රවලින් ද පැහැදිලි වෙයි. අභයගිරි භූමියෙහි ඇති සමාධි පිළිම වහන්සේ ද වෙනත් බොහෝ පුරා වස්තු ද යක්ෂ ගෝත්‍රිකයන්ගේ නිර්මාණ නම් පුදුම විය යුතු නො වේ. පස්වැනි සියවසේ ඉතිහාසය ලිවීමේ කාර්යය හේතුවෙන් අද දක්වා ම මෙරට ථෙරවාදය රැක ගැනීමටත් සිංහල ජාතිය පවත්වාගෙන යෑමටත් හැකියාව ලැබී ඇත. ඒ සියල්ල ධන පැත්ත ය. එහෙත් එහි සෘණ පැත්තක් නැතිවා නො වේ.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva